**ගම්පොළ නගර සභාව - 2023**

**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගම්පොළ නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ගම්පොළ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ශේෂ පත්‍ර දිනට අවසන් වී නොමැති නඩු 16 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගබඩා තොගය ගබඩා තොග ලේඛන සමඟ සැසඳීමේදී රු.137,590 ක් තොග ශේෂය වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂ හා ඒවාට අදාළ උපලේඛනවල ශේෂ සමඟ සැසඳීමේදී රු.73,205,271 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ආ) | වාහන සම්බන්ධව නඩත්තු කර ඇති ඉන්වෙන්ට්‍රි ලේඛනය අනුව කසළ කරත්ත 31 ක් පැවතියද මූල්‍ය ප්‍රකාශනවල | කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ලේඛන පවත්වාගත යුතුය. |

රු.815,559 ක කසළ කරත්ත 36 ක් දක්වා තිබුණු බැවින් කසළ කරත්ත 05 ක නොසැසඳීමක් විය.

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.4,436,417,684 ක ගිණුම් ශේෂ 11ක නීත්‍යානුකූල ඔප්පු, උපලේඛන, අදාළ ලිපි ලේඛන, ලිපිගොනු හා සනාථන ලිපි, ස්ථාවර තැන්පතු සහතික හා භෞතික පැවැත්ම පිළිබඳ තහවුරු ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | තොරතුරු නිවැරදි කරන බව | ගිණුම්ශේෂ තහවුරු කිරීමට අදාළ ලේඛන ලිපිගොනු යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |
| (ආ) | ශේෂ පත්‍රයේ ස්ථාවර වත්කම් වලට අදාළ උපලේඛනවල සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති එකතුව රු.6,610,525,372 ක ඉඩම් හා ගොඩනැගිලි 76 ක වටිනාකම් වෙන් වෙන්ව හඳුනාගැනීමට නොහැකි විය. | ඉදිරියේදී ලේඛනගත කරන බව. | නිවැරදිව ලේඛන පවත්වාගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) නගර සභා ආඥා පනත (255 අධිකාරය) (i )36 (ඉ) (ii) | අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව පුද්ගලයින් 134 දෙනෙකුට සභා ඉඩම් බදු දී තිබුණු අතර රු. 3,736,411ක බදු කුලී අයකර ගෙන නොතිබුණි. | විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබානොගත් බව. | පනතේ විධිවිධාන අනුව නිසි අනුමැතියක් යටතේ ඉඩම් බදු දිය යුතු අතර අදාළ බදු කුලී අයකරගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii)164 වගන්තිය | සභාව සතු තානායමේ 2019 සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.6,192,617 ක හිඟ කළමනාකරණ ගාස්තුව අයකරගෙන නොතිබුණි. | අදාළ මුදල් අයකිරීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව හිඟ ගාස්තු අයකළ යුතුය. |
| (ආ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ | | | |
| | (i) 28(1) ඡේදය | සභාව විසින් නිකුත් කරන ලද සංවර්ධන බලපත්‍රයක් නොමැතිව ඉදිකිරීම් 04 ක් පැවති බව සිදුකළ නියැදි පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. | ඉදිරියේදී අනුමැතිය සහිතව සැලසුම් ලබාදීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 84 ඡේදය | අනුමත කරන ලද සංවර්ධන බලපත්‍රය හා සංවර්ධන සැලැස්මට අනුව නිම කර පදිංචි වීම සඳහා අනුකූලතා සහතිකයක් ලබාදිය යුතු වුවත්, 2008 සිට සමාලෝචිත වර්ෂය දක්වා අනුමත කළ ගොඩනැගිලි අයදුම්පත්‍ර 1692 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පසු විපරම් කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | මුදල් රෙගුලාසි 371 (2) | අග්‍රිමයන් දෙන ලද කාර්යය නිම කළ විගසම පියවීමට කටයුතු කළ යුතු වුවත් 2011 සිට 2019 වර්ෂය දක්වා රු.225,000 ක අත්තිකාරම් 03 ක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. | අනුමැතිය ලද පසු පියවීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලිසි 394 | 2004 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලයට අදාළව නිකුත් කරන ලද පසුව අගරු වූ රු.563,753 ක චෙක්පත් 28 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ පරීක්ෂණ සිදුකරමින් පවතින බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව. |
| (iii) | මුදල් රෙගුලාසි 571 (3) | 2017 – 2020 කාලයට අදාළ කාලය ඉකුත් වූ රු. 814,533 ක තැන්පත් 62 ක් නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව |
| (iv) | මුදල් රෙගුලාසි 1646 | සමාලෝචිත වර්ෂයට අදාළ වාහන 13 ක ලොග් පොත් හා දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 | වසර 02ක කාලයක සිට වාහන 12 ක ඉන්ධන දැවීම පරීක්ෂා කර නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.67,273,302 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.68,793,142 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 30,200,000 | 33,362,196 | 31,601,307 | 60,698,191 | 30,050,000 | 32,936,986 | 33,682,260 | 58,937,302 |
| (ii) | කුලී | 34,050,000 | 30,694,111 | 25,056,372 | 33,130,845 | 24,375,000 | 22,453,198 | 24,846,697 | 27,493,106 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,800,000 | 3,685,664 | 3,737,664 | 21,000 | 3,300,000 | 2,737,733 | 2,689,733 | 73,000 |
| (iv) | වෙනත් ආදායම් | 56,420,000 | 49,285,454 | 40,905,259 | 79,869,177 | 57,750,000 | 69,060,026 | 56,843,948 | 71,488,982 |
| | | 123,470,000 | 117,027,425 | 101,300,602 | 173,719,213 | 115,475,000 | 127,187,943 | 118,062,638 | 157,992,390 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධන සම්බන්ධ නිරීක්ෂණ දැක්වේ.**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.60,698,191 ක් වූ අතර, ඒකකයක වරිපනම් බදු හිඟය රු.10,000 ත් රු.50,000 ත් අතර වරිපනම් ඒකක 1545 කින් එකතුව රු.28,670,115 ක් ද රු.50,000 ත් රු.100,000 ක් අතර වරිපනම් ඒකක 63 කින් රු.4,425,995 ක් හා රු.100,000 ඉක්මවූ වරිපනම් ඒකක 16 කින් රු.4,058,773 ක් විය. | දේපල තහනම මඟින් අය කිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අය කළ යුතුය. |
| (ii) | 1946 අංක 30 දරන වරිපනම් හා තක්සේරු ආඥා පනතේ 20 වගන්තිය ප්‍රකාරව වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වුවද, 2016 වර්ෂයේ තක්සේරු වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බදු අයකර තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | **කඩ කුලී** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කඩ කුලී ශේෂය රු.29,394,433 ක් වූ අතර, රු.100,000 ඉක්මවූ හිඟ කඩ කාමර කුලී අවස්ථා 36 කට අදාළ හිඟය රු.13,452,546 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නැවත සංශෝධනය සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යොමුකර ඇති බව. | හිඟ කඩ කුලී අයකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මේ අතරින් BSSC අංක දරන ලංගම බස් නැවතුම්පල කඩ සංකීර්ණයෙන් පමණක් 2014 සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලයට අදාළව රු.5,503,332 ක කඩ කාමර කුලී හිඟයක් පැවතුණි. | | |
| (ii) | සභාවට අයත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යන පුද්ගලික සමාගමකින් 2002 වසරේ සිට අයවිය යුතු රු.1,438,788 ක කඩ කුලී අය නොවීම හේතුවෙන් නඩු පවරා තිබූ අතර 2021 වර්ෂයේ එම කුලිය අයකර ගැනීමට දිසා අධිකරණයෙන් නියෝග ලබා දී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් අදාළ කුලී අයකර ගෙන නොතිබුණි. | අධිකරණ තීන්දුව ලැබීමට නියමිතව ඇති බව. | හිඟ කඩ කුලී අයකළ යුතුය. |
| (iii) | පොදු වෙළඳපොල සංකීර්ණයේ කඩ කාමර 38 ක් බදු දීමට නොහැකිව වසා දමා තිබුණු අතර ටෙන්ඩර් කර ව්‍යාපාර සඳහා පවරා දී තිබුණු කඩ කාමර 60 ක් ගිවිසුම්ගත වීමකින් තොරව අවිධිමත්ව බදු දී තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සියලු කඩ කාමර බදු දීමට කටයුතු කළ යුතු අතර විධිමත් බදු ගිවිසුම්වලට එළඹිය යුතුය. |
| **(ඇ)** | **වෙනත් ආදායම්** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ දැන්වීම් පුවරු ගාස්තු රු.1,368,020 වූ අතර ඒ තුළ පැවති 2020 – 2022 වර්ෂ වලට අදාළව රු.601,920 ක් අයකර නොතිබුණි. | හිඟ අය කර ගැනීම සඳහා කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (ii) | ත්‍රීරෝද රථ ගාස්තු සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිඟ ත්‍රීරෝද රථ ගාස්තු රු.6,798,757 ක් විය. ඒ තුළ 2016 – 2022 කාලයට අදාළ හිඟ ශේෂය රු.6,534,057 ක් අයකර නොතිබුණි. | හිඟ අය කර ගැනීම සඳහා කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (ඈ) | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,229,605 ක් හා මුද්දර ගාස්තු රු.64,559,085 ක් විය. | ඉදිරියේදී අයකර ගන්නා බව. | වර්ෂයට අදාළ මුද්දර ගාස්තු හා උසාවි දඩ ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂවල පුනරාවර්තන ආදායම් ප්‍රාදේශීය සංවර්ධනයට යොදවා ගැනීමකින් තොරව රු.133,233,067 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | සැලැස්මක් අනුව සංවර්ධන කටයුතු සඳහා යොදා ගන්නා බව. | අතිරික්ත මුදල් සංවර්ධන කටයුතු සඳහා යොදවා ගත යුතුය. |
| (ආ) | නගර සභාව විසින් එකතු කරනු ලබන ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ කළමනාකරණ ක්‍රමවේදයක් නොමැති වීම හේතුවෙන් හා කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව විසින් කසළ නොගැනීම හේතුවෙන් දඹුල්ල සහ උලපනේ කසළ අංගනය වෙත කසළ ප්‍රවාහනය කර තිබුණි.මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ඒ සඳහා රු.3,320,940 ක අමතර වියදමක් දැරීමට සිදුව තිබුණි. | කසළ ප්‍රමාණය වැඩි වීම හා කුණ්ඩසාලේ ප්‍රවාහනය දුෂ්කර වීම. | සභා බල ප්‍රදේශය තුළ කසළ කළමනාකරණය කර ගත යුතු අතර වියදම් අවම කර ගත යුතුය. |
| (ඇ) | නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 118 වගන්තියේ විධිවිධාන වලට අනුව ප්‍රදේශයේ නිවාසවල මල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ගලී රථ සේවාවක් පවත්වාගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ව්‍යාපාතියක් ඉදිකිරීමට සැලසුම් කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 03 ක එකතුව රු.5,771,954 ක් වූ අතර ඉන් වසර 1 ත් 5 ත් කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.50,868 ක් හා වසර 5 ට වැඩි කාලයක් පවතින එකතුව රු.3,721,086 ක් විය. | අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂ අය කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.27,348,898 ක් වූ අතර ඉන් වසර 1 ත් 5 | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |

ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.8,781,131 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.6,616,328 ක් විය.

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති රු.9,041,373 ක වාහන 03 ක් හා රු.613,800 ක ට්‍රේලර් 04 ක් වසර 01 ත් 08 ත් අතර කාල පරාසයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | ඉදිරියේදී වෙන්දේසි කිරීමට හා අලුත්වැඩියා කිරීමට කටයුතු කරන බව. | අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාවට අයත් පොදු වෙළඳපොලේ මස් කඩ 05 ක් 2016 වර්ෂයේ සිට අරමුණුගත කාර්යයකට යොදවා ගැනීමකින් තොරව වසා දමා තිබුණි. | ටෙන්ඩර් කිරීමට කටයුතු කරන බව. | ටෙන්ඩර් කර ආදායම් උපයාගත යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.1,600,000 ක ඩබල් ඩෑම් රෝලර් යන්ත්‍රය, රු.53,500 ක අංක 44 ශ්‍රී 7691 දරන ට්‍රේලරය හා රු.4,394,000 ක බොබ්කැට් යන්ත්‍රයේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට ගැනීමට කටයුතු කරන බව. | අයිතිය පවරා ගත යුතුය. |
| (ආ) | සභාවට අයත් සඳසිරිවත්ත භූමියේ ඉඩම් කට්ටි 98 ක අනවසරව පුද්ගලයින් පදිංචි වී තිබුණද එම පදිංචිකරුවන් ඉවත්කර සභාවේ දේපලවල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි. | එන්බීආර්ඕ වාර්තා ලබා ගැනීමෙන් පසු ක්‍රියාමාර්ග ගන්නා බව. | සභා දේපලවල ආරක්ෂාව තහවුරු කර ගත යුතුය. |
| (ඇ) | පැවරුම් නියෝග මඟින් සභාවට පැවරී තිබුණු බෝතලාපිටිය ඉඩම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් තක්සේරු කිරීමට කටයුතු කරන බව. | තක්සේරු වාර්තා ලබා ගැනීමට හා නීත්‍යානුකූල ලියවිලි ඉදිරිපත් කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී ඉන් තනතුරු 03 ක පුරප්පාඩු 76 ක් ද එක් තනතුරක අතිරික්තතා 11 ක් ද පැවතුණි. | පළාත් පාලන කොමසාරිස් කාර්යාලය දැනුවත් කර ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය. |
| (ආ) | 2001 සිට සමාලෝචිත වර්ෂය දක්වා කාල පරාසය තුළ ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගිය හා සේවය අතහැර ගිය නිලධාරීන් හා සේවකයින් 33 දෙනෙකුගෙන් එකතුව රු.1,180,614 ක ණය ශේෂයක් අයකර ගෙන නොතිබුණි. | අයකරගැනීම සඳහා කටයුතු කරන බව. | ණය ශේෂ අයකර ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒවා ලඟාකර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීමට කටයුතු කරන බව. | අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. |